**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. HRC/844/17<br>HRC/231/18<br>HRC/1710/19 | දිනය<br>திகதி<br>Date 2022.02.07 |

පැමිණිලි පාර්ශවය : කඩිගමුවගේ දුමිදු කල්යාන් මයා,
පී 108, ටොරින්ටන් නිවාස ක්‍රමය,
ටොරින්ටන් මාවත,
කොළඹ 05.

වගඋත්තර පාර්ශවය : අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
08 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

<u>පැමිණිලි අංක :</u> <u>එච්.ආර්.සී/844/17,</u>
<u>එච්.ආර්.සී/231/18,</u>
<u>එච්.ආර්.සී/1710/19</u>

පැමිණිල්ලෙන් දක්වා ඇති කරුණු :

පැමිණිලිකරු සංස්කෘතික දෙපාර්තමේන්තුව යටතේ රාජ්‍ය සංගීත ශිල්පියෙකු ලෙස ස්ථිර පත්වීමක් ලැබ ජාතික කලා භවනේ සේවය කරන අතර 2017.02.07 වන දින තම කාර්යාල භූමියේදී බොහෝ පිරිසක් ඉදිරිපිට ධනන්ජය සෝමසිරි නම් රාජ්‍ය සංගීත ශිල්පියෙකු විසින් පහරදුන් බවත්, ඒ සම්බන්ධව 2017.02.08 දින ප්‍රතිකාර සඳහා යාමට පෙර ෆැක්ස් මගින් ඒ බව කලා භවන ස්ථාන භාර නිලධාරිනිය දැනුවත් කළ බව ද සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂිකාව සහ අමාත්‍යාංශ ලේකම් ද දැනුවත් කර විනය පරීක්ෂණයක් පවත්වන ලෙස ලිඛිතව ඉල්ලීමක් කර ලියාපදිංචි තැපැල් මගින් ද ඒ බව දන්වා ඇති බවට පැමිණිල්ලෙන් පෙන්වා දී තිබේ.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo 04
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com

එහෙත් පසු දිනම එනම්, 2017.02.08 දින කරුණු සොයා බැලීමකින් තොරව වහාම ක්‍රියාත්මක වන පරිදි දඬුවමක් ලෙස තමාට ස්ථාන මාරුවක් ලබාදී ඇති බව ද තමාට පහරදුන් පුද්ගලයා හට පක්ෂපාතීව කටයුතු කර තිබූ බව ද පෙන්වා දී තිබේ. එයින් තම මානව අයිතිවාසිකම් උල්ලංඝනය වූ බව ද ආයතන සංග්‍රහයේ නෛතික ප්‍රතිපාදන උල්ලංඝනය වූ බව ද තමා කෲර අමානුෂික හිංසනයකට භාජනය වීමෙන් අනතුරුව තවදුරටත් තම වෘත්තීය ද අහිමි කර තිබීමෙන් ආයතන සංග්‍රහයේ නෛතික ප්‍රතිපාදන උල්ලංඝනය වූ බව ද එයින් තමා මූලික අයිතිවාසිකම් කඩවීමකට ලක්ව ඇති බව ද දක්වා තිබේ.

මෙම පහරදීම සම්බන්ධව කුරුඳුවත්ත පොලිසියේ සීඅයිබී 01 43/53 යටතේ පැමිණිල්ලක් 2017.02.07 දිනම පැමිණිලිකරු විසින් ගොනු කරන ලද බව ද වැඩිදුරටත් තම පැමිණිල්ලෙන් දක්වා තිබේ.

පැමිණිල්ලේ කරුණු සනාථ කිරීමට අමුණා ඇති ලේඛන :

1. 2017.02.14 දින පැමිණිලිකරු, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකාව ලෙස කටයුතු කළ අනූෂා ගෝකුල මහත්මිය වෙත ලියන ලද ලිපියේ පිටපත අමුණා ඇත. එහි ඇත්තේ සේවා අවශ්‍යතාවය මත කළ අනුයුක්ත කිරීම පළමුව ප්‍රධාන කාර්යාලයට ද දෙවනුව 2017.02.13 දිනැති ලිපිය අනුව නැවත ජන සංගීත පර්යේෂණ මධ්‍යස්ථානයට කළ ස්ථාන මාරුව අනුව රාජකාරී භාරගත් බව ලිඛිතව වාර්තා කර තිබීම සම්බන්ධව ය. එමෙන්ම තමාට සිදුවූ අසාධාරණය පිළිබඳව කරුණු දක්වා තමාට පහරදුන් පුද්ගලයාට එරෙහිව වහාම ක්‍රියාත්මක වී විනය පරීක්ෂණයට යටත් කරවන ලෙස ද සේවා අවශ්‍යතාවය මත තමා ස්ථාන මාරු කිරීමට කිසිදු හේතුවක් නොමැති බව ද ආයතන සංග්‍රහයේ II වන බාණ්ඩයේ xLViii පරිච්ඡේදයේ 1:2 වගන්තිය අනුව පියවර නොගැනීමෙන් තමාට අසාධාරණයක් සිදුවූ බව ද දක්වා ඇති අතර තබ්ලා වාදන ශිල්පියෙකු ලෙස කටයුතු කිරීම පැමිණිලිකරු තම රාජකාරිය බැවින් ඉන් පරිබාහිරව ජන සංගීත සංරක්ෂණ මධ්‍යස්ථානයකට ස්ථානමාරු කිරීමේ හේතුවක් නොමැති බැවින් නිසි නීතිමය හෝ විනය පියවරක් ගන්නා තෙක් ස්ථාන මාරුව අවලංගු කරන ලෙස ද පැමිණිලිකරු ඉල්ලා තිබේ. එහි පිටපත් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඇතුළු තවත් ආයතන වෙත ද ලබාදී ඇති බව සඳහන් කර තිබේ.

2. 2017.02.08 දින සේවයට වාර්තා කිරීමට නොහැකි බවත් පහරදීම මත ප්‍රතිකාර ගැනීමට යන බැවින් සුව වූ වහාම සේවයට වාර්තා කරන බවත් දක්වා ඇති ලිපිය ද පැමිණිල්ලට අමුණා කරුණු තහවුරු කර ගැනීමට යොමු කර ඇත.

4. 2017.02.07 දින අධිකරණ වෛද්‍යවරයාට පරීක්ෂා කිරීමට පොලිසිය විසින් නිකුත් කළ රිසිට්පත හා රෝගියා පරීක්ෂා කළ බවට අදාළ ලේඛන පිටපත අමුණා ඇත.

5. කොළඹ නගර සභාවේ තිඹිරිගස්යාය ඩිස්පෙන්සරියේ වෛද්‍ය නිලධාරී විසින් පැමිණිලිකරු පරීක්ෂා කර බලා නිකුත් කළ වෛද්‍ය සහතිකය අමුණා ඇත.

ඒ අනුව පැමිණිලිකරු තම පැමිණිල්ල ගොනු කරමින් ඉල්ලා සිටින්නේ රාජකාරී වැඩ තහනම් කළ ලිපිය ශූන්‍ය හා බල රහිත කරන ලෙස ද පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවන ලෙස ද අත්හිටුවන ලද වැටුප හා සාධාරණ වන්දියක් ද ඔහු සේවය කරමින් සිටියදී ප්‍රමාණවත් කරුණු තිබේනම් විනය පරීක්ෂණයක් සඳහා කටයුතු කරවන ලෙස ද මූලික අයිතිවාසිකම් කඩවූ බවට නිර්දේශයක් ද වේ.

2018.01.22 දින පැමිණිලිකරු එච්ආර්සී/231/17 අංකය යටතේ ද පැමිණිල්ලක් ගොනු කර දක්වා ඇත්තේ ඔහුගේ සේවය අත්හිටුවා තිබීම ඉවත් කර නැවත සේවයේ පිහිටුවා ගැනීම හා ඊට අදාළ ඉල්ලීම් වේ.

පැමිණිලිකරු එච්ආර්සී/1710/19 ඉහත අංකය යටතේ 2019.06.19 දින නැවත ද පැමිණිල්ලක් ගොනු කරමින් ජාතික කලා භවනේ සේවය කරමින් සිටියදී සිදුවූ සිදුවීම් පිළිබඳව හා විනය පරීක්ෂණ පිළිබඳ දක්වා ඉල්ලා සිටින්නේ, පහරදීම, තර්ජනය හා පරීක්ෂණ කටයුතු සම්බන්ධව නීතිය ඉදිරියේ අසමානකොට සැලකීම විභාග කර වැටුප් සහිතව සේවයේ පිහිටුවා සියළු වරප්‍රසාද සමග මූලික අයිතිවාසිකම් කඩ කළ බවට නිර්දේශයක් ලබා දෙන ලෙස යි.

**වගඋත්තරකරුගේ කරුණු දැක්වීම හා පරීක්ෂණයේදී අනාවරණය කරගත් කරුණු :**

මෙම සිදුවීමට අදාළව පරීක්ෂණ කටයුතු සිදු කරන ලද බව ද පැමිණිලිකරු ඔම්බුඩ්ස්මන්වරයා වෙත ද පැමිණිල්ලක් ගොනු කර ඇති බව ද වගඋත්තරකරු කියා සිටිමින් ස්ථාන මාරුව සිදු කරන ලද්දේ දඬුවමක් වශයෙන් නොව පහරදීමක් හා සම්බන්ධ සිද්ධියක් බැවින් මූලික පරීක්ෂණ සිදුවන අතරතුර තවදුරටත් පැමිණිලිකරුගේ ආරක්ෂාවට තර්ජනයක් සිදුවියහැකි බැවින් බව දන්වා සිටින ලදි. පැමිණිලිකරුගේ විනය බලධරයා සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂකවරයා බැවින් තීරණ ගැනීමේදී අධ්‍යක්ෂවරයා සතු බලතල යටතේ කටයුතු කළ බව ද ආයතන සංග්‍රහයේ XLViii පරිදි විනය පරිපාටිය ද අනුගමනය කළ බව ද ත්‍රිපුද්ගල කමිටුවක් මගින් තොරතුරු රැස් කර ගනිමින් පවතින බව ද එකී කමිටුවේ නිර්දේශය මත පුද්ගලයින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නා බව ද දක්වා සිටින ලදි.

2017.10.10 දින සිතාසි ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සිදු කරන ලදි. එදින වගඋත්තරකරුවන් දක්වා සිටියේ මෙම පැමිණිලිකරුට පහරදීම සම්බන්ධව සිදු කල පැමිණිල්ල පිළිබඳ මූලික පරීක්ෂණ කටයුතු ආරම්භ කර සියළු පාර්ශවයන් වෙතින් ප්‍රකාශ ලබාගෙන ඉදිරි පියවරට නියමිත බවය. එමෙන්ම පැමිණිලිකරු විසින් ඔම්බුඩ්ස්මන් වරයා වෙත ද මේ පිළිබඳ පැමිණිල්ලක් කිරීමෙන් පසු එය විභාග කර නිර්දේශය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත 2017.09.18 දින ලබාදී ඇත.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) විසින් කරන ලද නිර්දේශයේ ඇති කරුණු අනුව පෙනී යන්නේ ඔම්බුඩ්ස්මන් වරයා තම නිර්දේශයෙන් පැමිණිලිකරු නැවත ඔහු සේවය කල ස්ථානයට ස්ථාන ගතකළයුතු බව තහවුරු කර ඇති බවයි.

එමෙන්ම පැමිණිලිකරු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ද සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්ට ද ජනාධිපති කොමිසමේ ලේකම් වෙත ද පැමිණිලි කර ඇති බව අනාවරණය වේ.

කෙසේ වෙතත් පැමිණිලිකරු කොමිෂන් සභාවට 2019.12.10 දින දක්වා ඇත්තේ පැමිණිලිකරුට එරෙහිව පැවැත්වූ විනය පරීක්ෂණයක දී පැමිණිලිකරු ඊට වරදකරු වී ඔහුගේ සේවය අවසන් කර ඇති බවයි. එම විනය පරීක්ෂණයට අදාල චෝදනාවට හේතු වී ඇත්තේ පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කළ පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි ලබාදීමේදී භාවිතා කළ ලේඛනයක් සම්බන්ධව ඇති වූ ගැටළුවක් බව අනාවරණය වේ. එනම්, එකී ලේඛනය (පැමිණිලිකරු සේවය කරන ආයතනයේ පැමිණීමේ ලේඛනයේ පිටපතක්) දෙපාර්තමේන්තුවට නොදන්වා ලබාගැනීම වැරදි බවට දක්වා ඒ අනුව පවත්වන ලද පරීක්ෂණයකි. පැමිණිලිකරු මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ ලේඛනයක් දෙපාර්තමේන්තුවේ නිසි අවසරයකින් තොරව ලබාගත් ලේඛනයක් බවට දක්වා ඊට එරෙහිව පරීක්ෂණයක් පැවැත්වූවද පැමිණිලිකරු කියා සිටින්නේ මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 19 වන වගන්තියට ද 19(1), 19(2) හා 19(3) උප වගන්ති වලට අනුව එකී ලේඛනය ඉදිරිපත් කළ ද තමාට යම් විනිර්මුක්තියක් ඒ සඳහා ඇති බවයි. එනම්, ඉහත වගන්ති අනුව "කොමිෂන් සභාව ඉදිරියේ කරන ලද හෝ දෙන ලද යම් ප්‍රකාශයක් පිළිබඳ කිසිම සාක්ෂියක් යම් අධිකරණයක නඩු පැවරීමකදී හෝ සිවිල් වූ හෝ අපරාධ වූ හෝ වෙනත් නඩු කටයුත්තක දී හෝ ඒ තැනැත්තාට විරුද්ධව ආවේශ්‍ය කරගනු නොලැබියයුතු ය " යන ප්‍රකාශය ද "කොමිෂන් සභාව ඉදිරියේ දෙන ලද ලිඛිත වූ හෝ වාචික වූ හෝ සාක්ෂියක් සම්බන්ධයෙන් කිසිම තැනැත්තෙකු යම් අධිකරණයකදී, යම් නඩුවකට නඩු පැවරීමකට හෝ සිවිල් වූ හෝ අපරාධ වූ හෝ වෙනත් නඩු කටයුත්තකට යටත් නොවිය යුතුය" යන්න පිළිබඳ කියැවෙන ප්‍රකාශයන් හි නීතිමය ආවරණය පැමිණිලිකරුට ලැබියයුතු බව ය.

තවද සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ රාජ්‍ය සංගීත කණ්ඩායමට අනුයුක්තව කොන්ත්‍රාත් පදනම මත සේවය කළ පැමිණිලිකරු <u>2017.10.24</u> දින ස්ථිර පත්වීම් ලබා <u>පරිවාස</u>

කාලයකට යටත්ව සේවය කර ඇත. 2017.02.07 දින පැමිණිලිකරුට පහරදුන් බවට ලිපියක් ජාතික කලාභවන භාර ස්ථාන භාර නිලධාරිතියට ලබාදී ඇත. ඊට අදාළ පරීක්ෂණ කටයුතු කරන තුරු ඔහුගේ ආරක්ෂාව වෙනුවෙන් ස්ථාන මාරුවීමක් 2017.02.22 දින ලබාදෙන බව ද එය විනය ක්‍රියා මාර්ගයක් නොවන බවට දක්වා තිබේ. 2017.05.02 දින නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කළ පසු පහරදීම පිළිබඳ පරීක්ෂා කර එම වාර්තාව 2017.10.13 දින දෙපාර්තමේන්තුවට ලබාදී ඇත. පැමිණිලිකරු මානව හිමිකම් කොමිෂන් සභාවට ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශයේ පිටපතක් දෙපාර්තමේන්තුවට ලබාදී ඇති බව ද දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ලබාගත් ලේඛනයක් වන ජාතික කලා භවනේ කාර්ය මණ්ඩලයේ පැමිණීමේ ලේඛනයේ පිටපතක් අනවසරයෙන් ලබාගෙන තිබීම ආයතන සංග්‍රහයේ xxviii පරිච්ඡේදයේ 4:1 වගන්තියට අනුව වරදක් බැවින් නිදහසට කරුණු විමසා ඇති බව දක්වා ඇත. නමුත් එකී කරුණු අනුව විනයානුකූලව කටයුතු කරමින් ආයතන සංග්‍රහයේ XLviii පරිච්ඡේදයේ 31:1:11 වගන්තිය අනුව 2018.01.08 දින සිට වැඩ තහනම් කර ඇති බව දක්වා තිබේ. මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලිකරු දිවුරුම් ප්‍රකාශය සමග ලබාදුන් ඉහත කී ජාතික කලා භවනෙහි කාර්ය මණ්ඩලයේ පැමිණීමේ ලේඛනයේ පිටපත් තවත් බාහිර පාර්ශවයන් වෙත ද ඉදිරිපත් කර ඇති බව රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශය විසින් සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් වෙතින් විමසා ඇති බව ද නිල ලේඛනයක පිටපතක් තිසි අවසරයකින් තොරව ලබාගෙන තිබීම ද විනය පරීක්ෂණය පවත්වා ඇත්තේ ද ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට යටත්ව බව සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ. අනුෂා ගෝකුල ප්‍රනාන්දු මිය ඉහත වාර්තාව ඉදිරිපත් කරමින් දක්වා තිබේ. එහි වැඩිදුරටත් දක්වා ඇත්තේ ව්‍යාජ අත්සනක් යොදා තිබීම පිළිබඳව සොයා බැලීමට රජයේ රස පරීක්ෂක වෙත අදාළ ලේඛන ලබාදී ඇති බව ද ය.

පැමිණිලිකරු 2019.06.10 දින වගඋත්තරකරු වෙත නැවත සේවයේ පිහිටුවීමට කළ ඉල්ලීම් ලිපියේ පිටපතක් ද ගොනුවට ඇතුළත් කර තිබේ. නමුත් එකී ලිපියට පැමිණිලිකරුට 2019.06.13 දින වගඋත්තරකරු විසින් පිළිතුරු ලබාදී ඇති අතර එකී කරුණු ආයතන සංග්‍රහයේ xxviii පරිච්ඡේදයේ 4:1 වගන්තියද XLviii පරිච්ඡේදයේ 31:1:11 ද XLviii පරිච්ඡේදයේ 31:10 හා 31:12 වගන්ති අනුව බව පැහැදිලි කර දී පැමිණිලිකරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබේ.

පරීක්ෂණ පැවැත්වීමෙන් අනතුරුව ලබාගත් වගඋත්තරකරුගේ වාර්තාවට අනුව පහත කරුණු අනාවරණය වේ. මෙම සිදුවීම සම්බන්ධව මූලික විමර්ශනයක් පවත්වා පැමිණිලිකරුට පහරදීමට සම්බන්ධ වූ සංගීත ශිල්පී ඩී.සී.ඩී.වික්‍රමආරච්චි යන අයට ආයතන සංග්‍රහයේ XLviii පරිච්ඡේදයේ 24:2:2 වගන්තිය අනුව තදින් තරවටු කර ලිපියක් නිකුත් කර ඇති බව ද තවදුරටත් සංගීත කණ්ඩායමේ අධීක්ෂණ කටයුතු භාර අධ්‍යක්ෂ වෙත අධීක්ෂණ උපදෙස් දී ඇති බව ද දක්වා තිබේ. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට ප්‍රමාණවත් කරුණු මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශය අනුව නොතිබුණු බැවින් ඒ සඳහා කටයුතු නොකළ බව ද දක්වා තිබේ. නිල අවසරයකින් තොරව යම් දෙපාර්තමේන්තුගත ලේඛනයක් පැමිණිලිකරු විසින් ලබාගෙන තිබීම සම්බන්ධව පවත්වන

පරීක්ෂණ කටයුතු පිළිබඳව ද දක්වා ඇති අතර එයට අනුව පැමිණිලිකරුගේ වැඩ තහනම් කළ බව ද එම විනය පරීක්ෂණය පැවැත්වීමට ඒකපුද්ගල විනිශ්චය සභාවක් නම් කර පසුව පරීක්ෂණ නිලධාරියෙකු තෝරා ගන්නා ලද්දේ රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරණ අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කර ඇති විනය පරීක්ෂණ නිලධාරී නාමලේඛනයෙන් අහඹු ලෙස බව ද දක්වා ඇත.

2017.05.29 දින පරීක්ෂණ අවස්ථාවේදී වැඩිදුරටත් කරුණු දක්වමින් රාජ්‍ය සංගීත කණ්ඩායම වෙනුවෙන් ජාතික කලා භවනේ ස්ථිර රාජ්‍ය සේවකයෙකු ලෙස පැමිණිලිකරු කටයුතු කරන ලද බව දක්වා සිටින ලදි. මෙම රාජ්‍ය සංගීත කණ්ඩායමේම කටයුතු කළ රජයේ නිලධාරීන් කිහිප දෙනෙකු විසින් පැමිණිලිකරුට සිදු කළ පහරදීම පිළිබඳව කලා භවන භාර ස්ථානභාර නිලධාරී හට කරුණු වාර්තා කර පසුව පැමිණිලිකරු රෝහල් ගතව ඇති අතර ඒ බව අධිකරණ වෛද්‍ය වාර්තා රිසිට්පත මගින් තහවුරු කළ අතර කුරුඳුවත්ත පොලිස් ස්ථානය වෙත ද ඔහු පැමිණිලි කර ඇති බව පෙනී යයි. පොලිසිය පැමිණිල්ල විභාග කර සමථ මණ්ඩලයට යොමු කර ඇත. සමථ කළ නොහැකි වීමෙන් 2017.05.06 දින සමථ මණ්ඩලයේ කටයුතු අවසන් කර ඇත. තමාට කළ පහරදීම පිළිබඳව ලිඛිතව ස්ථාන භාර නිලධාරිනියට දන්වා තිබූ පසු. පසු දින පැමිණිලිකරු ජාතික කලා භවනෙන් ඉවත් කර පළමුව සංස්කෘතික දෙපාර්තමේන්තුවට ද නැවත ජන සංගීත සංරක්ෂණ ආයතනය වෙත ද සේවා අවශ්‍යතාවය මත බව දක්වා ස්ථාන මාරු කර තිබේ. පහරදීම සිදු කළ ධනන්ජය නැමැති අය මෙම පරීක්ෂණ අවස්ථාවේ විදේශ ගතව සිටි බව ද වැඩිදුරටත් පෙන්වා දෙන ලදි.

**නිරීක්ෂණ හා නිගමන :**

- පැමිණිලිකරු ගොනු කළ පැමිණිලිවලට අදාලව ලැබී ඇති වාර්තා ද පරීක්ෂණ දිනවල දෙපාර්ශවයන් ඉදිරිපත් කළ කරුණු ද අනුව අනාවරණය වන්නේ, පැමිණිලිකරු ස්ථාන මාරු කිරීම සිදු කර ඇත්තේ පැමිණිලිකරුගේ ආරක්ෂාවට බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කළ ද එය පිළිගත නොහැකි කාරණාවක් බවත් පැමිණිලිකරුට පහරදුන් තැනැත්තන් ජාතික කලා භවනෙන් ඉවත් කර නියමිත මූලික පරීක්ෂණ සිදු කළයුතුව තිබීමය. නමුත් සිදුව ඇත්තේ පැමිණිලිකරු සේවා ස්ථානයෙන් ඉවත් කිරීමය.

- පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ලබාදෙන ලද දිවුරුම් ප්‍රකාශයේ එක් ඇමුණුමක් වන්නේ ජාතික කලා භවනේ සේවකයන්ගේ පැමිණීමේ නාම ලේඛනයේ පිටපතක් වන අතර එය නිල වශයෙන් අවසර ලබාගෙන ඉදිරිපත් කළ ලේඛනයක් නොවන බවට වගඋත්තරකරුවන් දක්වා ඊට එරෙහිව විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව ද පෙනී යන ලදි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ ප්‍රතිපාදන යටතේ කොමිෂන් සභාව ඉදිරියේ දෙන ලද ලිඛිත හෝ වාචික

සාක්ෂීන්ට එරෙහිව වෙනත් නඩු කටයුතු පැවරිය නොහැකි නමුත් මෙම ලේඛනය පැමිණිලිකරු සන්තකයට පත්ව තිබීම හා ආයතනයේ නිසි අවසරයකින් තොරව ලබාගැනීම පිළිබඳ කරුණු විමර්ශනය කිරීමට වගඋත්තරකරු කටයුතු කිරීම මත මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 19 වන වගන්තියේ ඇති ව්‍යාතිරේඛීය සහනය පැමිණිලිකරුට හිමි නොවන බව නිරීක්ෂණය වේ.

- විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව පැමිණිලිකරුගේ වැඩ තහනම් කර ඇති අතර පසුව විනය පරීක්ෂණයේ නියෝගය අනුව පැමිණිලිකරුගේ සේවය අවසන් කර තිබීම මත වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට එරෙහිව කටයුතු කර තිබේ.

- පැමිණිලිකරු ඔම්බුඩ්ස්මන් වරයා වෙත ගොනු කළ පැමිණිල්ලකට අනුව කරුණු විභාග කර බලා නිර්දේශයක් ලබාදී ඇති අතර එම නිර්දේශය ක්‍රියාත්මක කිරීම පැහැරහැර තිබීමෙන් වගඋත්තරකරු විසින් ඔම්බුඩ්ස්මන්ගේ නිර්දේශය ක්‍රියාත්මක කිරීම පැහැර හරින ලද ආයතනයක් බව ද නිරීක්ෂණය වේ.

- පැමිණිලිකරුට පහරදුන් තැනැත්තන්ට එරෙහිව පවත්වන ලද මූලික පරීක්ෂණයේ නිර්දේශය අනුව එකී පහරදුන් තැනැත්තාට තදින් තරවටු කිරීම සිදු කර ඇතත් විනය පරීක්ෂණය කිරීමට තරම් කරුණු අනාවරණය වී නැති බව වාර්තා කර තිබීම ද පහර කෑමට ලක්වූ පැමිණිලිකරු වැඩ තහනමකට කර තිබීම ද යුක්ති සහගත භාවයකින් තොරව ක්‍රියා කළ අවස්ථාවක් බව නිරීක්ෂණය වේ.

- තවද පැමිණිලිකරුට පහරදීම සිදු වන්නට හේතු වී ඇත්තේ පැමිණිලිකරු දිගින් දිගටම ජාතික කලා භවනේ සිදුව ඇති දූෂණ හා අක්‍රමිකතා ඔහු හඳුනාගත් කරුණු පිළිබඳ පෙන්වා දීමට යාමෙන් බව පෙනී යන අතර වගඋත්තරකරුවන් විසින් පහරදුන් තැනැත්තන් හට ක්‍රියා කර ඇති ආකාරයත් පැමිණිලිකරුට එරෙහිව කටයුතු කර ඇති ආකාරයත් අනුව නීතිය ඉදිරියේ ඇති සමානාත්මතාවයේ මූලධර්මය බිඳ වැටීමකට ලක් වූ බවක් පෙන්නුම් කෙරේ.

- පැමිණිලිකරුට පහරදුන් තැනැත්තාට එරෙහිව සිදුකළ පරීක්ෂණයේදී පහරදුන් තැනැත්තාට තදින් තරවටු කිරීම පමණක් සිදු කර පහර ලද පැමිණිලිකරු ඔහුගේ සේවා ස්ථානයෙන් ඉවත් කිරීම සාධාරණ හේතුවකින් තොරව කර ඇති බව ස්ථාන මාරු ලිපිය අනුව අනාවරණය වේ. එය සේවා අවශ්‍යතාවය මත සිදු කළ බව දක්වා කොමිෂන් සභාවේ පරීක්ෂණයේදී එය පැමිණිලිකරුගේ ආරක්ෂාව පතා සිදු කළ බව දක්වා තිබීමෙන් වගඋත්තරකරුවන් පක්ෂග්‍රාහීව කටයුතු කර ඇති බව පෙනී යයි.

- තවද පැමිණිලිකරු කොමිෂන් සභාව වෙත කලා භවනේ සේවක පැමිණීමේ ලේඛනය නිල අවසරයකින් තොරව ලබාගෙන ඇති බවට දක්වා ඊට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණයේදී ඔහුගේ වැඩ තහනම් කිරීමට පියවර ගැනීම තවදුරටත් පැමිණිලිකරුගේ සේවය අවසන් කිරීම දක්වා තීරණ ගැනීමට වගඋත්තරකරුවන් ගත් උත්සාහයේ ප්‍රතිඵලය බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරුට එකී විනය පරීක්ෂණයේදී සාධාරණ සවන්දීමක් සිදු කළාද යන්න සැක සහිත බව නිරීක්ෂණය වේ.

- තවද පැමිණිලිකරු ජාතික කලා භවනේ සිට සංස්කෘතික දෙපාර්තමේන්තුව වෙත පළමුව ද දෙවනුව ජන සංගීත පර්යේෂණ ආයතනය වෙත ද ලෙස ස්ථාන මාරු කරමින් එය සේවා අවශ්‍යතාවය මත බව දක්වා තිබීම හා පසුව පැමිණිලිකරුගේ ආරක්ෂාව වෙනුවෙන් එසේ කළ බව ප්‍රකාශ කිරීම සාධාරණ හා යුක්ති සහගත එකක් නොවන අතර එය ද්වේශ සහගත පදනම මත සිදු කරන ලද එකක් බැවින් වගඋත්තරකරුවන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කළ බවද නිරීක්ෂණය වේ.

- පැමිණිලිකරුට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණය අතරතුර පැමිණිලිකරු විසින් දක්වන ලද විරෝධතා සලකා බලා නැති බව ද විනය පරීක්ෂණය පවත්වන නිලධාරියාට එරෙහිව දක්වා ඇති කරුණු ද සලකා බැලීමෙන් තොරව විනය පරීක්ෂණය ඒක පාර්ශ්විකව පවත්වා ඇති බව පැමිණිලිකරු දක්වා ඇති කරුණු අනුව තහවුරු වන අතර ඉන් ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය වී ඇති බව ද අභියාචනාධිකරණයේ අංක CA/590/81 හි තීන්දුගත කරණු අනුව පිළිගත් නීතිමය සිද්ධාන්ත වගඋත්තරකරුවන් උල්ලංඝනය කර ඇති බවද; පාර්ශවයකට සවන් නොදීමෙන් ගන්නා ලද තීරණය ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය කිරීමට හේතුවක් වන බැවින් මූලික අයිතිවාසිකම් ද උල්ලංඝනය වී ඇති බවද, නිරීක්ෂණය වේ.

නිර්දේශය :

1. පැමිණිලිකරුට ආයතන සේවකයෙකු විසින් ආයතන භූමිය තුළදී පහරදීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන්ට පැමිණිලි කිරීමෙන් පසු කටයුතු කළ ආකාරය හා පැමිණිලිකරු පමණක් ස්ථාන මාරු කිරීම මගින් වගඋත්තරකරුවන් පැමිණිලිකරුට වෙනස්කොට සැලකීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට නිර්දේශ කරනු ලැබේ.

2. පැමිණිලිකරුට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණයට අනුව පැමිණිලිකරු වැඩ තහනමකට ලක් කර විනය පරීක්ෂණයේ අවසන් තීරණය අනුව පැමිණිලිකරු සේවයෙන් පහ කිරීම පිළිබඳ මේවනවිට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කර ඇති බැවින් අදාළ විනය පරීක්ෂණයෙන් පැමිණිලිකරුට යම් අගතියක් සිදුවී ඇත්නම් ඒ පිළිබඳ සුදුසු තීරණයක් ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන බැවින් එකී තීරණ ගැනීමේදී මානව හිමිකම් කොමිෂන් සභාවේ මෙම නිර්දේශයේ සඳහන් කරුණු සැලකිල්ලට ගන්නා ලෙස යෝජනා කෙරේ.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, රෝහිණී මාරසිංහ,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ආචාර්ය එම්. එච්. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත:- 01. ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02. ලේකම්,
බුද්ධ ශාසන, ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

දි/- ශි/